# 'මුල් බුදුසමය' හඳුනා ගැනීම පිළිබඳ දාර්ශනික විමසුමක්

හෝමාගම ධම්මානන්ද හිමි[1]

## හැඳින්වීම

බුදු දහම අධ්‍යයනය කිරීමට ප්‍රවේශ වන නවකයකු නිතැතින් නගන ප්‍රශ්නයක් වන්නේ 'බුදු දහම යැයි හඳුනා ගන්නේ කුමක්ද?' යන්නයි. මෙය තවත් සරලව සඳහන් කරන්නේ නම් බුදු දහම හඳුනා ගන්නේ කෙසේද? යන්නයි. එයට හේතුව බුදු දහම විවිධ නාමයන්ගෙන් හඳුන්වා තිබීමයි. එනම් මුල් බුදු සමය, ථේරවාදය, ස්ථවිර වාදය, හීනයානය, මහායානය, තන්ත්‍රයානය, වජ්‍රයානය, සෙන් බුදු දහම, හුවායෙන් බුදු දහම, ශ්‍රී මුඛ දේශනා, බුද්ධ ධර්මය, නවංග සත්ථු ශාසනය, නවලොව්තුරු දහම, පෙළ දහම, ත්‍රිපිටකය, ආදී වශයෙනි. මේ නම් සියල්ල ම පොදුවේ භාවිත වන්නේ, එක ම බුද්ධ දේශනාව හැඳින්වීම සඳහාය. එහෙත් මේ සෑම යෙදුමක ම එකිනෙකට වෙනස් අර්ථ ඇති බව ද සැලකිය යුතුය. එයට හේතුව මේ බොහෝ යෙදුම් සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු නිශ්පන්න වූ ඒවා බැවිනි. ඉහත සඳහන් කළ නවකයාට ඇතිවන ගැටළුව වන්නේ පිරිසිදු බුද්ධ වචනය වන්නේ මෙයින් තුමක්ද? නොඑසේ නම් මේ සියල්ල බුද්ධ වචනය ලෙස සැලකෙනවාද? යන්නයි. මේ සඳහා යථොක්ත නවකයාට විචාරාත්මක වූ කිසියම් මග පෙන්වීමක් සිදු කිරීම මෙම පර්යේෂණ අධ්‍යයනයෙහි මූලික අරමුණයි. මේ සඳහා කළ යුතු එකම සහ ප්‍රධාන කාර්ය විය යුත්තේ **'මුල් බුදු සමය'** හෙවත් **'පිරිසිදු බුද්ධ වචනය'** කුමක්ද යන්න නිර්වචනය කිරීමයි.

## අධ්‍යයන ක්‍රමවේදය

ථේරවාද ත්‍රිපිටකය සහ අට්ඨකථාව ප්‍රමුඛ ලෙසත් නූතන දෙස් විදෙස් විස්වතුන් විසින් ලියා පල කර ඇති කීතීන් ද්විතීක සෙලත් පරිශීලනය කොට කරුණු ඉදිරිපත් කිරීම මගින් මෙම ගැටළුව අධ්‍යයනය කෙරේ.

## දත්ත විශ්ලේෂණය

බුදු දහම හැඳින්වීම සඳහා නිශ්පන්න වූ යථොක්ත නාම මාලාව කෙරෙහි අවධානය යොමු කිරීමට ප්‍රථම බුදුන් වහන්සේ ධරමාණ සමයෙහි උන්වහන්සේ විසින්ම තමන් වහන්සේගේ දේශනාව හඳුන්වා තිබෙන්නේ කෙසේද යන්න විමසා බැලීම යෝග්‍යය. ත්‍රිපිටකයෙහි බෙහෝ තැන මේ හැඳින්වීම් විසිර තිබේ. ඒ අතර 'ධම්ම', 'ධම්මචක්ක', 'සද්ධම්ම', 'ධම්මවිනය', 'බ්‍රහ්මචරිය', 'සාසන','පාවචන', යනාදිය විශේෂයෙන් සඳහන් කළ හැකිය. එහෙත් මෙම යෙදුම් අතර ඉහතින්

---

1 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.

සඳහන් කළ ආකාරයේ භාවිතයන් මෙන් අර්ථ වශයෙන් එකිනෙකට පරස්පරවූ වෙනසක් නැත. එයට හේතුව මෙයින් කිසිදු සංස්කරණයකට හෝ අර්ථ විපර්යාශයකට භාජනය නොවූ එක ම බුද්ධ වචනය හැඟවෙන බැවිනි. එසේ ද වුවත් බුදුන් ධරමාන සමයෙහි ම බුද්ධ දේශනාව සාවද්‍ය ලෙස ගෙන ප්‍රකාශ කෙරුණු අවස්ථා ද අපට හමුවේ. ගද්ධබාදිපුබ්බ අරිට්ඨ ස්ථවිරයන් වහන්සේගේ පුවත මෙයට කදිම නිදසුනකි. එහෙත් එය බරපතල සහ දුරදිග ගිය ගැටළුවක් බවට පත් නොවූයේ බුදුරජාණන් වහන්සේ එම භික්ෂුව කැඳවා එය විනිශ්චය කොට නිවැරදි කරවීමට කටයුතු කළ බැවිනි.

බුදුන් වහන්සේ විසින් ශ්‍රී මුඛයෙන් දේශනා කොට වදාළ පිරිසිදු බුද්ධ වචනය කිසියම් ආකාරයක වර්ගී කරණයකට හෝ සංස්කරණයකට භාජනය වන්නේ, සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු ශාසන භාරධාරී මහතෙරවරුන් විසින් සිදු කරන ලද පළමු සංගායනාව ආදී සංගායනා ඔස්සේ බව ශාසන ඉතිහාසය සාක්ෂි දරයි. ඒබව පළමු සංගායනාවෙන් පසු සංගීතිකාරක මහතෙරවරුන් විසින් කරන ලද ප්‍රකාශයෙන් ම සනාථ වේ.

වර්තමානයේ අප ව්‍යවහාර කරන හා භාවිත කරන විවිධ නම් බුද්ධ දේශනාව සඳහා යෙදී ඇත්තේ සම්බුද්ධ පරිනිර්වානයෙන් පසුව බවත් ඒවා නිකම්ම භාවිතයට ආවා නොව ඒ සඳහා ඓතිහාසික පුසුබිමක් පැවති බවත් පශ්චාත්කාලීන සංගායනා විමසීමෙන් සනාථ වේ. මෙම බොහෝ නම් භාවිතයට එන්නේ විවිධ නිකායයන් බිහිවීම ඔස්සේ වන අතර එම නිකායයන් හට ගන්නේ වරින් වර පවත් වන ලද සංගායනාවන්ගේ ද ප්‍රතිඵල වශයෙනි.

සම්බුද්ධ දේශනාව හැඳින්වීම සඳහා යෙදෙන මෙහි ආරම්භයේදී ම සඳහන් කළ නාම මාලාව එකිනෙකට වෙනස් අර්ථ ගන්නා බව සඳහන් කරන ලදී. එහෙත් සාමාන්‍ය ජන විඥානය තුළ මේ නම්වල එකිනෙක අතර පවත්නා බරපතල වෙනස්කම් හෝ පරස්පරතාවන් පිළිබඳ හැඟීමක් හෝ වැටහීමක් හෝ අවබෝධයක් ඇතැයි කිව නොහැකිය. ඒ පිළිබඳව විවරණය කෙරෙන්නේ, මෙවන් වූ ශාස්ත්‍රීය අධ්‍යයනයකදී හෝ විද්වත් සාකච්ඡාවකදී පමණි. බුදු දහම පිළිබඳව වඩාත් නිවැරදිව සහ නිශ්චිතව මත ප්‍රකාශ කළ හැක්කේ සහ අර්ථ කථන ඉදිරිපත් කළ හැක්කේ ජන ව්‍යවහාරයට වඩා ශාස්ත්‍රීය ව්‍යවහාරය පැහැදිළි වූ විටදීය. මෙහිදී අප උත්සාහ ගන්නේ වෙන් වෙන් වූ එක් එක් ව්‍යවහාරය පිළිබඳව අර්ථ කථන ඉදිරිපත් කිරීමට නොව මුල් බුදු සමය හා එහි ව්‍යවහාරය හෙවත් භාවිතය කෙසේදැයි කරුණු කාරණා සහිතව යම් පමණකට නිරවුල් කරගැනීමටය.

මෙහිදී පළමුවෙන් ම සඳහන් කළ යුතු කරුණක් වන්නේ **'මුල් බුදු සමය'** ***(early Buddhism)*** යන ව්‍යවහාරය පිළිබඳව විද්වතුන් අතර නිශ්චිත එක් පිළිගැනීමක් නොමැති බවයි. එනම් විවිධ මතභේද පවතින බවයි. මේ සම්බන්ධයෙන් මත රාශියක් පෙරදිග හා අපරදිග විද්වතුන් විසින් ඉදිරිපත් කර ඇත. ඒවා නිරන්තරයෙන් එකිනෙක හා ගැටෙන බව ද පෙන්වා දිය හැකිය.

**'මුල්බුදු සමය'** කවරේද? යන්න පිළිබඳ ඉදිපත්වී ඇති මත අතර ඉතා ප්‍රබල අදහසක් වන්නේ 'බුද්ධ පරිනිර්වාණයෙන් පසු පවත් වන ලද පළමු ධර්ම සංගායනාවෙන් (පඤ්චසතිකක්ඛන්ධකය) ඒකරාශි කරන ලද ධර්ම විනය දෙක **'මුල්බුදු සමය'** ලෙස පිළිගත යුතුය' යන්නයි. මෙයට සාධක වශයෙන් ඉදිරිපත් කරන්නේ, චුල්ලවග්ගපාළියේ පඤ්චසතිකක්ඛන්ධකයෙහි සහ සමන්තපාසාදිකා නම් විනය අටුවාවේ එන ප්‍රකාශයකි. එනම් බුද්ධ පරිනිර්වාණයෙන් සත් දිනක් ගත වූ තැන රැස්වූ භික්ෂු මහා සංඝයා අතර සිටි මහකසුප් මහ රහතන් වහන්සේ අනෙකුත් භික්ෂූන් අමතා, 'ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ සිට කුසිනාරාවේ පරිනිර්වාණ මඤ්චකයේදී දේශනා කරන ලද අවසන් බුද්ධ වචනය දක්වා වූ සියලු බුද්ධ වචනය විවිධ පාර්ශවයන් අතින් සිදු විය හැකි විකෘති කිරීම්ගෙන්, පිරිසිදු ධර්මය සුරක්ෂිත කිරීම සඳහා සාමූහිකව එකතුවී සංගායනා කරමුය යි යන ඓතිහාසික ප්‍රකාශ යයි.

මුල් බුදු සමය කුමක්ද? යන්න පිළිබඳව ප්‍රචලිත දෙවන මතය වන්නේ, සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු මුල් බුදු සමයක් ගැන අපට කථා කළ නොහැකිය යන මතයයි. මෙම මතය දරන්නන්ට අනුව පළමු සංගායනාව ද මුළුමනින් ම මුල් බුදු සමය සංග්‍රහ කළ එකක් නොව මුල් බුදු සමය ආශ්‍රය කොට සමීප ශ්‍රාවකයන් විසින් සංස්කරණය කරන ලද්දකි. මෙය සනාථ කිරීම සඳහා මොවුන් උපුටා දක්වන්නේ පළමු ධර්ම සංගායනාවේ පසුබිමෙහි එන මූලික කරුණු තුනකි. එනම් **මෙම සංගායනාවට තුඩුදුන් ආසන්නතම සිද්ධිය වන සුභද්‍ර හිමියන්ගේ ප්‍රකාශය, බුද්දානුබුද්දක සික්ෂා පද පිළිබඳ විවාදය, සහ පුරාණ තෙරුන්ගේ ප්‍රකාශය යන කරුණු තුනයි.**

එම මතයන්ට අතිරේකව කෙනෙකු සඳහන් කරන්නේ, පඨම සම්බෝධිය හෙවත් බුද්ධත්වය ලබා පළමු වසර විස්ස දක්වා වූ කාලය මුල් බුදු සමය පැවති කාලය ලෙස ගත යුතු බවයි. තවත් කෙනෙකු පෙන්වා දෙන්නේ නිකාය භේදය හටගන්නා තුරු එනම් තෙවන සංගායනාව දක්වා කාලය මුල් බුදු සමය පැවති කාලය ලෙස සැලකිය යුතු බවයි. මේ සඳහා විවිධ කරුණු, කාරණා මේ අය විසින් ඉදිරිපත් කරනු දක්නට ලැබේ.

මීලඟට අපගේ අවධානය යොමු වන්නේ, මුල් බුදු සමය කුමක්දැයි? නිර්ණය කිරීමේදී එහි අන්තරගත කරුණු පදනම් කොට ඉදිපත් කොට ඇති මතය විමසීම කෙරෙහිය. එනම් මුල් බුදුසමයට අයත් දේශනා මේවාය, පසුකාලීන දේශනා මේවායැයි පෙන්වමින් මුල් බුදු සමයේ සීමා මායිම් නිර්දේශ කළ මතය විභාග කර බැලීමටය. මුල් බුදු සමය කුමක්දැයි? යන ප්‍රශ්නයට මෙම මතයෙන් ලැබෙන පිළිතුර වන්නේ, **චතුරාර්ය සත්‍ය, පටිච්චසමුප්පාදය, කර්මය හා පුනර්භවය, ත්‍රිලක්ෂණ සිද්ධාන්තය, අනාත්ම දර්ශනය, ආර්ය අෂ්ටාංගික මාර්ගය** ආදී මූලික ඉගැන්වීම් මුල් බුදු සමය බවයි. නොඑසේ නම් මුල් බුදු සමයට අයත් දේශනා බවයි. මෙය වඩාත් ප්‍රචලිත සහ බොහෝ විද්වතුන්ගේ පිළිගැනීමට ලක්ව

අති මතයයි. එයට හේතුව වශයෙන් ඔවුන් පෙන්වා දෙන්නේ ථෙරවාදය සහ මහායානය ඇතුළු සියලු බෞද්ධ නිකායයන් මෙම ඉගැන්වීම් කිසිදු භේදයකින් තොරව එකසේ පිළිගෙන ඇත යන්නයි.

මුල් බුදු සමය පැවති කාලරාමුව පිළිබඳව අවධානය යොමු කළ මහාචාර්ය කේ.එන්. ජයතිලක ශූරීන්, සමකාලීන සහ පූර්වකාලීන විද්වත් අදහස් ද සම්පිණ්ඩනය කොට ඉදිරිපත් කර ඇති අදහස මෙයට කිසියම් ආලෝකයක් සපයයි. ඉන්දීය දර්ශන පිළිබඳ පුළුල් අධ්‍යයනයක් සිදු කළ විද්වතකු වන එස්. රාධාක්‍රිෂ්ණන් මේ අදහස සනාථ කරයි. මීට වඩා තරමක අන්තගාමී මතයක් ඉදිරිපත් කරන ඒ.එල්.බෂාම් සඳහන් කරන්නේ බුදුන් වහන්සේගේ මුල් ම දේශනාව ලෙස සැලකෙන ධම්මචක්කප්පවත්තන සූත්‍රදේශනාව පවා පිළිගත නොහැකි බවත් අද අප අතට පත්ව ඇති ත්‍රිපිටකය සියවස් කිහිපයක් තිස්සේ සංවර්ධනය වූවක් බවත්ය. බුදු දහම පිළිබඳ අධ්‍යයනය කළ බටහිර විද්වතකු වූ ආචාර්ය ඒ.ජේතෝමස් මේ සම්බන්ධයෙන් ප්‍රකාශ කරන්නේ, කිසියම් මධ්‍යස්ථ මතයකි. මෙයින් පෙනී යන්නේ බුදු දහම පිළිබඳව පුළුල් අධ්‍යයනයන් සිදු කළ ප්‍රාමාණික විද්වතුන් අතරින් බටහිර උදවිය පමණක් නොව පෙරදිග ඇත්තන්ද මුල් බුදු සමය පිළිබඳ මහත් වූ සැක සංකා මතු කොට ඇති බවයි.

**සමාලෝචනය**

මෙම සියලු කරුණු කාරණා සමාලෝචනය කිරීමේදී අපට හැඟී යන්නේ, බුදුන් වහන්සේගේ ශ්‍රී මුඛ දේශනා සහ බුදුන් වහන්සේ ධරමාන කාලයෙහි උන්වහන්සේගේ අනුමැතිය ලැබූ ශ්‍රාවක දේශනා මුල් බුදු සමය ලෙස ගැනීම වඩාත් නිවැරදි බවයි. එහෙත් ගැටළුව වන්නේ මේ දේශනා අනිකුත් දේශනාවන්ගෙන් වෙන් කර ගන්නේ කෙසේද යන්න හා එම දේශනා අඩංගු වන්නේ කිනම් නිකාය හෝ සම්ප්‍රදාය තුළද යන්නයි. ඓතිහාසික සාධකත් කරුණුවල ප්‍රාමාණිකත්වයත් තාර්කික පදනමත් විමසන විට මුල් බුදු සමය ඒ අයුරින්ම කිසිදු සම්ප්‍රදායයක් සතුව නැති බවත් මුල් බුදු සමය ඇසුරු කොට ගොඩනැගුණු සම්ප්‍රදා පමණක් විද්‍යමාන වන බවත් ඒ අතරින් මුල් බුදු සමයට වඩාත් සමීප සම්ප්‍රදාය වන්නේ හීනයානය හෙවත් ථේරවාදය බවත් අපගේ පිළිගැනීමයි. මෙම පිළිගැනීම තුළින් මුල් බුදු සමයේ අගයට හා වටිනාකමට කිසිදු හානියක් සිදු නොවන බව ද සඳහන් කළ යුතුය.

**මුඛ්‍ය පදඃ-** මුල් බුදු සමය, සංගායනා, බුද්දානුබුද්දක සික්ඛා, පුරාණ තෙරුන්, ථේරවාදය, මහායානය.

**ආන්තික සටහන්**

අධිගතෝ ඛෝ මඤායං ධම්මෝ ගම්භිරෝ දුද්දසෝ..... *ම.පා 1,* බු.ජ.ත්‍රි, 10 පිට, ධම්මචක්කං පවත්තේතුං-ගච්ඡාමි කාසිනං පුරං.... *ම.පා 1,* බු.ජ.ත්‍රි, 16 පිට, ......සද්ධම්මට්ඨිතියා, විනයානුග්ගහාය, *අං.නි. 6, දසකනිපාතය, උපාලිවර්ගය, උපාලි සූත්‍රය,* බු.ජ.ත්‍රි. 124 පිට, ....යෝ ඉමස්මිං ධම්මවිනයේ අප්පමත්තෝ විහෙස්සති...... *සං නි. 1 බ්‍රහ්ම සංයුත්තය. අරුණවතී සූත්‍රය.* බු,ජ.ත්‍රි. 284 පිට, බ්‍රහ්මචරියං පකාසේථ. *ම.පා 1,* බු.ජ.ත්‍රි, 42 පිට, එතං බුද්ධාන සාසනං. *දී.නි 2, මහාපදාන සූත්‍රය,* බු.ජ.ත්‍රි 72 පිට, අතීතසත්ථුකං පාවචනං, නත්ථි නෝ සත්ථාති. *දී.නි. 2 මහාපරිනිබ්බාන සූත්‍රය,* බු.ජ.ත්‍රි. 242 පිට, අතීතසත්ථුකං පාවචනන්ති, මඤ්ඤමානා පක්ඛං ලභිත්වා නචිරස්සේව සද්ධම්මං අන්තරධාපෙයපුං. *සමන්තපාසාදිකානම්වූ විනයට්ඨකථා බාහිර නිදාන වණ්ණනා.* සංස්කාරක, රඹුක්වැල්ලේ විපස්සී හිමි, සමයවර්ධන පොත්හල කොළඹ, 2005, 54 පිට.

ඥානාරාම හිමි, පාතේගම, *මුල් බුදු මය හා විවරණ ගැටළු,* සිංගප්පූරු බෞද්ධ භාවනා මධ්‍යස්ථානය, 1996, 03 පිට.

ජයතිලක.කේ.එන්. *මුල්බුදුසමයේ ඥානවිභාගය,* පරිවර්තනය, හේ.මූ.තිලකරත්න, ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, 2003, සංඥාපනය, xvi පිට.

රාධාක්‍රිෂ්ණන්, එස්. *ඉන්දීය දර්ශනය,* ඉහත, 288 පිට.

බෂාම් ඒ.එල්. *අසිරිමත් ඉන්දියාව,* පරිවර්තනය, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, කොළඹ, 1965, 336 පිට.

තෝමස් ඒ. ජේ *බෞද්ධ චින්තාවේ ඉතිහාසය,* පරිවර්තනය, ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ. 1966,44 පිට. .